සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2015 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2015 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2015

ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය I
கிறிஸ்தவ நாகரிகம் I
Christian Civilization I

49 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
*Two hours*

**උපදෙස්:**
- ※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ※ උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- ※ උත්තර පත්‍රයේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- ※ **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **පිළිතුරු පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.**

**1.** 'බැබිලෝනියා' යන්නෙහි අර්ථය
(1) නවාතැනයි. (2) විවෘත ප්‍රදේශයයි.
(3) ස්වර්ගීය දොරටුවයි. (4) කල්දිවරුන්ගේ දේශයයි.
(5) ඇතුළුවීමයි.

**2.** 'සංස්කෘතික තොටිල්ල' නමින් හැඳින්වනුයේ,
(1) ඊජිප්තුවයි. (2) බැබිලෝනියාවයි. (3) සිරියාවයි.
(4) ග්‍රීසියයි. (5) මෙසපොතේමියාවයි.

**3.** ජුදෙව්වරුන්ගේ ප්‍රධාන මංගල්‍යයක් **නො වන්නේ,**
(1) පාස්කු මංගල්‍යය ය. (2) මළවුන්ගේ මංගල්‍යය ය.
(3) කූඩාරම් මංගල්‍යය ය. (4) පෙන්තකොස්ත මංගල්‍යය ය.
(5) දේවස්ථානය කැපකිරීමේ මංගල්‍යය ය.

**4.** ශුද්ධ බයිබලයේ 'කිරියෙන් පැණියෙන් ඉතිරෙන දේශය' ලෙස හැඳින්වූයේ,
(1) මිසර/ඊජිප්තු දේශයයි. (2) පර්සියාවයි. (3) පලස්තීනයයි.
(4) කානාන් දේශයයි. (5) ජෝර්දානයයි.

**5.** පැරණි ඊශ්‍රායලයේ අවසාන විනිශ්චයකාරයා වන්නේ,
(1) දානියෙල් ය. (2) සැම්සන් ය. (3) ජෝසුවා ය. (4) දෙබෝරා ය. (5) සැමුවෙල් ය.

**6.** සලමන් රජතුමා වඩාත් ප්‍රචලිත වූයේ,
(1) යුද්ධ පිළිබඳ වූ දක්ෂතාව නිසා ය. (2) ඔහු තුළ වූ ප්‍රඥාව නිසා ය.
(3) පාලන දක්ෂතාව නිසා ය. (4) රට සශ්‍රීක දේශයක් කළ නිසා ය.
(5) විදෙස් රටවල් සමඟ තිබූ සමීප සම්බන්ධතාව නිසා ය.

**7.** මතෙව් 5 : 7 - 12 හි සඳහන් භාග්‍යවන්තකමේ ප්‍රකාශවල සඳහන් **නො වන්නේ,**
(1) දේව රාජ්‍යය ය. (2) ශුද්ධාත්මයාණෝ ය. (3) සාමය ය.
(4) අල්පේච්ඡතාව ය. (5) වැළපීම ය.

**8.** ජුදා සමාජය තුළ ඉහළ ම මට්ටමේ සිටි පිරිස වශයෙන් සැලකුයේ
(1) උත්තම පූජකවරු සහ පරිසිවරු ය. (2) බදු අයකරන්නන් සහ පරිසිවරු ය.
(3) සදිසිවරු සහ පරිසිවරු ය. (4) සදිසිවරු සහ උත්තම පූජකවරු ය.
(5) සදිසිවරු සහ ලේකම්වරු ය.

**9.** ජේසුන් වහන්සේගේ කාලයේ දී පලස්තීන සමාජයේ පහත්කොට සැලකූ සමාජ පන්ති දෙකක් වූයේ,
(1) සදිසිවරුන් සහ පරිසිවරුන් ය. (2) නායක පූජකවරුන් සහ බදු අයකරන්නන් ය.
(3) බදු අයකරන්නන් සහ සමරිතානවරුන් ය. (4) සමරිතානවරු සහ එඬේරුන් ය.
(5) එඬේරුන් සහ සෙලට්වරුන් ය.

[දෙවැනි පිටුව බලන්න.

**10.** ක්‍රිස්තුන් වහන්සේගේ කාලයේ කාන්තාවන් සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A - සමාජය කාන්තාවන්ට ගෞරවයෙන් සැලකී ය.
B - භාර්යාවකට පුරුෂයා කෙරෙහි නීතිමය බලයක් නැත.
C - ආගමික කටයුතුවල දී කාන්තාවන්ට ප්‍රමුඛස්ථානයක් හිමි විය.
D - කාන්තාවන් සහ පුරුෂයන් එක්ව ආහාර නොගත්හ.
E - ජුදා පුරුෂයකු කාන්තාවක සමඟ වැඩිපුර කථා නොකළ යුතු ය.
ඉහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ,
(1) A, B සහ D ය. (2) A, C සහ D ය. (3) B, C සහ D ය.
(4) B, D සහ E ය. (5) C, D සහ E ය.

**11.** කාන්තාරයේ පියවරුන් අතර පළමුවැන්නා වශයෙන් සැලකෙන්නේ,
(1) ඇලෙක්සැන්ඩ්‍රියාවේ සිරිල්තුමා ය. (2) ඊජිප්තුවේ අන්තෝනිතුමා ය.
(3) ශාන්ත අම්බ්‍රෝස්තුමා ය. (4) ශාන්ත බැසිල්තුමා ය.
(5) ශාන්ත අගුස්තීනුතුමා ය.

**12.** එලියස් දිවැසිවරයාගේ ආනුභාවයෙන් බිහි වූ තාපස නිකාය
(1) බෙනඩික්‍ටාන තාපස නිකායයි. (2) සිස්ටසියන් තාපස නිකායයි.
(3) අගුස්තීනු තාපස නිකායයි. (4) ට්‍රැපිස්ට් තාපස නිකායයි.
(5) කාර්මෙල් තාපස නිකායයි.

**13.** කිතුනු තාපස ක්‍රමය පළමුවෙන් ම බිහි වූ රටවල් දෙක නම්,
(1) ඊජිප්තුව සහ ඊශ්‍රායලයයි. (2) සිරියාව සහ ඇලෙක්සැන්ඩ්‍රියාවයි.
(3) ග්‍රීසිය සහ සයිප්‍රසයයි. (4) ඊජිප්තුව සහ සිරියාවයි.
(5) සිරියාව සහ පලස්තීනයයි.

**14.** වේදභේදයක් යනු,
(1) සභාවේ ධර්මතාවලට එරෙහි ව කරන ඉගැන්වීමකි.
(2) සභා නායකයන් අතර ධර්මය පිළිබඳ ව ඇති වන ගැටුමකි.
(3) විශ්වාසයේ සත්‍යතාවලට එරෙහි ව කෙරෙන ඉගැන්වීමකි.
(4) ක්‍රිස්තියානි ධර්මයට එරෙහි ව කැරළි ගැසීමකි.
(5) විවිධ කිතුනු සභා මගින් කෙරෙන එකිනෙකට වෙනස් ඉගැන්වීම් සමූහයකි.

More Past Papers at
tamilguru.lk

**15.** නෙස්ටෝරියස්තුමා විසින් දැරූ වේදභේදීය මතය වූයේ,
(1) ක්‍රිස්තුන් වහන්සේට ඇත්තේ මනුෂ්‍ය ස්වභාවය පමණක් බවයි.
(2) ක්‍රිස්තුන් වහන්සේ තුළ දේව සහ මනුෂ්‍ය ස්වභාව වෙන වෙන ම පවතින බවයි.
(3) ක්‍රිස්තුන් වහන්සේ දෙවියන් වහන්සේ විසින් මවන ලද බවයි.
(4) මරියතුමිය දෙවියන් වහන්සේගේ මව නොවන බවයි.
(5) ක්‍රිස්තුන් වහන්සේගේ දේවත්වය මනුෂ්‍යත්වයට වඩා උතුම් බවයි.

**16.** පස්වන ශතවර්ෂය වන විට මුළුමනින් ම ක්‍රිස්තියානි ධර්මයට හැරී තිබුණු රට වන්නේ,
(1) එංගලන්තයයි. (2) ප්‍රංශයයි. (3) ඉතාලියයි. (4) ඊශ්‍රායලයයි. (5) ස්පාඤ්ඤයයි.

**17.** පහත සඳහන් කරුණු සලකා බලන්න.
A - අධිරාජ්‍යය පුරා වූ සාමකාමී වාතාවරණය
B - කොන්ස්තන්තීනු අධිරාජයා කිතුනු දහම වැළඳ ගැනීම
C - ජුදා ජාතිකයන් කිතු දහම ප්‍රතික්ෂේප කිරීම
D - කිතුනුවන් මුහුණ පෑ පීඩනය
E - රෝම අධිරාජ්‍යය පුරා ග්‍රීක භාෂාව කථා කිරීම
ඉහත සඳහන් කරුණු ඇසුරෙන් රෝම අධිරාජ්‍යය තුළ ක්‍රිස්තියානි ධර්මය ඉක්මනින් පැතිරී යාමට හේතු වූ කරුණු තුනක් වන්නේ,
(1) A, B සහ C ය. (2) A, C සහ B ය. (3) A, D සහ E ය. (4) B, C සහ E ය. (5) C, D සහ E ය.

**18.** බෙනදික්‍ටාන තාපස නිකායේ ආදර්ශ පාඨය වන්නේ,
(1) 'කීකරුකම සහ දිළිඳුකම' ය. (2) 'යාච්ඤාව සහ දිළිඳුකම' ය.
(3) 'යාච්ඤාව සහ වැඩ කිරීම' ය. (4) 'වැඩ කිරීම සහ කීකරුකම' ය.
(5) 'යාච්ඤාව සහ ව්‍රතශුද්ධිය' ය.

[තුන්වැනි පිටුව බලන්න.

**19.** යාවක නිකායන් බිහිවීම සම්බන්ධ පහත සඳහන් වැකි සලකා බලන්න.

A - ශුද්ධ වූ සභාව සැම තැන ව්‍යාප්ත කිරීම
B - ක්‍රිස්තුන් වහන්සේගේ දුගී බව අනුගමනය කිරීම
C - සියල්ල පොදුවේ තබා ගැනීම
D - ලෞකික නොව ආධ්‍යාත්මික සැපත ළඟා කර ගැනීම
E - සභා නායකයන්ට කීකරු ව ජීවත් වීම

ඉහත සඳහන් කරුණු අතුරෙන් යාවක නිකායක් බිහිවීමට හේතු වූ කරුණු තුනක් වන්නේ,

(1) A, B සහ C ය. (2) A, B සහ D ය. (3) A, C සහ D ය. (4) A, C සහ E ය. (5) A, D සහ E ය.

**20.** පළමු යාවක නිකාය ලෙස සැලකෙන්නේ,

(1) ෆ්‍රැන්සිස්කාන නිකායයි. (2) වැල්දෙන්සියානු නිකායයි.
(3) දොමිනිකාන නිකායයි. (4) අගුස්තීනු නිකායයි.
(5) බෙනඩික්ටාන නිකායයි.

**21.** මධ්‍යතන යුගයේ සිදු වූ සභා ප්‍රතිසංස්කරණවලට හේතු වූයේ,

(1) (සභාව තුළ) ආධ්‍යාත්මික පිරිහීමයි. (2) පැවිදිවරය සඳහා කැඳවීම් අඩු වීමයි.
(3) අධිරාජයා සභාව පාලනය කිරීමයි. (4) රෙප්‍රමාදු ප්‍රතිසංස්කරණය ඇති වීමයි.
(5) පැරණි ජන වන්දනා ක්‍රම වෙනස් කිරීමයි.

**22.** ස්විංග්ලිතුමා සම්බන්ධයෙන් පහත සඳහන් වැකි සලකා බලන්න.

A - විශ්වාසයේ එකම නීතිය බයිබලයයි.
B - ප්‍රසාද නිධාන මගින් වරප්‍රසාද නොලැබෙයි. ඒවා සංකේත පමණකි.
C - ප්‍රසාද නිධාන ලෙස සැලකිය හැක්කේ, ප්‍රසාද ස්නාපනය, අභිවෘද්ධි ආලේපය සහ ආශිර්වාදකාර බන්ධනයයි.
D - දිව්‍ය සත්ප්‍රසාදයෙහි ක්‍රිස්තුන් වහන්සේ ජීවමාන ව වැඩ නොසිටින සේක.
E - ගැලවීම ලබන්නන් දෙවියන් වහන්සේ විසින් දැනට ම තෝරාගෙන ඇත.

ඉහත සඳහන් ප්‍රකාශ අතුරෙන් ස්විංලිතුමාගේ ප්‍රධාන ඉගැන්වීම් තුනක් වන්නේ,

(1) A, B සහ D ය. (2) A, B සහ E ය. (3) A, C සහ D ය. (4) B, C සහ D ය. (5) B, D සහ E ය.

**23.** මෙතෝදිස්ත සභාවේ නිර්මාතෘවරයා වන්නේ,

(1) VIII වැනි හෙන්රි රජතුමා ය. (2) විලියම් කේරිතුමා ය.
(3) තෝමස් මුන්ස්ටර්තුමා ය. (4) උල්රිච් ස්විංග්ලිතුමා ය.
(5) ජෝන් වෙස්ලිතුමා ය.

**24.** පුනර්ජීවනය පාදක කොටගෙන පහත සඳහන් වැකි සලකා බලන්න.

A - මධ්‍යතන යුගයේ දී පුද්ගලයකුට අයිතිවාසිකම් මත වරප්‍රසාද ලැබිය හැකි විය.
B - පුනර්ජීවනය හේතු කොටගෙන පහත් පන්තියක උපත ලද පුද්ගලයකුට සමාජයේ උසස් තත්ත්වයක් කරා යාමට හැකි විය.
C - මධ්‍යතන යුගයේ දී මැද පන්තියට අයත් ව්‍යාපාරිකයකුට ජීවිතයේ උසස් තත්ත්වයක් කරා යාමට අපහසු විය.

ඉහත සඳහන් වැකිවලින් නිවැරදි වැකිය හෝ වැකි වන්නේ,

(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.
(4) A සහ B පමණි. (5) A සහ D පමණි.

**25.** සභා නවෝදය සම්බන්ධයෙන් පහත සඳහන් පැවිදි නිකායන් ගැන සලකා බලන්න.

A - දොමිනිකාන නිකාය
B - ජේසු නිකාය
C - කැපුචින් ෆ්‍රැන්සිස්කන් නිකාය
D - අගුස්තීනු නිකාය
E - වින්සෙන්තියාන නිකාය

ඉහත සඳහන් නිකායන් අතුරෙන් මධ්‍යතන යුගයේ දී සභා නවෝදයට දායක වූ පැවිදි නිකායන් තුනක් වනුයේ,

(1) A, B සහ C ය. (2) A, B සහ E ය. (3) A, C සහ D ය. (4) B, C සහ D ය. (5) B, D සහ E ය.

**26.** පහත සඳහන් දේව ධර්මාචාර්යවරුන් අතුරෙන් දොමිනිකාන නිකායට අයත් **නො වන** දේවධර්ම ශාස්ත්‍රඥයා වන්නේ,

(1) ශාන්ත මහා ඇල්බට්තුමා ය. (2) ශාන්ත තෝමස් ඇක්වයිනස්තුමා ය.
(3) ඊවෙස් කොන්ගා පියතුමා ය. (4) ලග්රාන්ජ් පියතුමා ය.
(5) ශාන්ත VII වැනි ග්‍රෙගරි පාප්තුමා ය.

**27.** සර් අයිසෙක් නිව්ටන් නමැති විද්‍යාඥයා සම්බන්ධයෙන් පහත සඳහන් වැකි අතුරෙන් **නොගැළපෙන** වැකිය වන්නේ,
(1) ඔහු 'හිරු රැස්වල වර්ණ පිහිටා ඇත' යන සත්‍යය හෙළිදරව් කළේ ය.
(2) සූර්ය මණ්ඩලය සම්බන්ධයෙන් කරුණු හෙළිදරව් කළේ ය.
(3) ඔහු විසින් ආදේශක පරාවර්තන දුරේක්ෂයක් නිපදවන ලදී.
(4) මුහුදේ වඩදිය සහ බාදිය පිළිබඳ කරුණු අනාවරණය කළේ ය.
(5) ඔහු විසින් සාපේක්ෂතා වාදය හඳුන්වා දෙන ලදී.

**28.** ආසියාව තුළ වැඩි ම කතෝලික ජනගහනයක් ඇත්තේ,
(1) කොරියාවේ ය. (2) ජපානයේ ය. (3) පිලිපීනයේ ය.
(4) චීනයේ ය. (5) ඉන්දියාවේ ය.

**29.** ඉන්දියාවේ තුළ ඇති කතෝලික සභාවට අයත් පෙරදිග සභා දෙකක් වන්නේ,
(1) සීරෝ මලබාර් සහ ජැකොබයිට් සභාව ය.
(2) සීරෝ මලබාර් සහ සීරෝ මලංකාර සභාව ය.
(3) සීරෝ මලංකාර සභාව සහ මාර් තෝමා සභාව ය.
(4) මාර් තෝමා සභාව සහ ඕර්තඩොක්ස් සභාව ය.
(5) ඕර්තඩොක්ස් සභාව සහ සීරෝ මලංකාර සභාව ය.

**30.** ඉන්දියාවේ පිහිටුවන ලද පළමුවන ප්‍රොතෙස්තන්ත සභාව වන්නේ,
(1) ඇන්ග්ලිකන් සභාවයි. (2) මෙතෝදිස්ත සභාවයි.
(3) බැප්ටිස්ට් සභාවයි. (4) ප්‍රෙස්බිටරියන් සභාවයි.
(5) ලුතරන් සභාවයි.

**31.** පෘතුගීසි පාලන සමය තුළ ශ්‍රී ලංකාවේ සේවය කළ පැවිදි නිකායන් තුනක් නම්,
(1) ෆ්‍රැන්සිස්කාන නිකාය, කාර්මෙල් නිකාය හා අගුස්තීනු නිකායයි.
(2) දොමිනිකාන නිකාය, ජේසු නිකාය හා බෙනඩික්ටාන නිකායයි.
(3) අගුස්තීනු නිකාය, ඔරතෝරියානු නිකාය හා ජේසු නිකායයි.
(4) ෆ්‍රැන්සිස්කාන නිකාය, දොමිනිකාන නිකාය හා ජේසු නිකායයි.
(5) අගුස්තීනු නිකාය, ජේසු නිකාය හා කාර්මෙල් නිකායයි.

**32.** ශුද්ධ වූ ජුසේවාස්තුමා ශ්‍රී ලංකාවට පැමිණීමට හේතු වූයේ,
(1) ශ්‍රී ලංකාව තුළ කතෝලික පූජකවරුන්ගේ හිඟයයි.
(2) ලන්දේසින් විසින් කතෝලිකයින්ට පීඩා කිරීමයි.
(3) දේශනා කිරීම මුල් කොටගෙන කතෝලික ධර්මය පැතිර වීමයි.
(4) ඔරතෝරියානු නිකාය ලංකාව තුළ පිහිටුවීමයි.
(5) එතුමාගේ ජනප්‍රියත්වය නිසා ශ්‍රී ලංකාවේ කතෝලිකයන් විසින් එතුමන්ට මෙරටට පැමිණීමට ආරාධනා කිරීමයි.

**33.** ලන්දේසි පාලන සමයේ ගෝවේ සිට ශ්‍රී ලංකාවට පූජකවරුන් එවූ නිකාය නම්,
(1) ඔරතෝරියානු නිකාය ය. (2) ෆ්‍රැන්සිස්කාන නිකාය ය.
(3) අගුස්තීනු නිකාය ය. (4) කාර්මෙල් නිකාය ය.
(5) ජේසු නිකාය ය.

**34.** සමාජ සාධාරණත්වය නගා සිටුවීමෙහි හා දුගීන්ට සේවය කිරීමෙහි නිරත වූ තිදෙනකු වන්නේ,
(1) එස්. ජී. පෙරේරා පියතුමා, පීටර් පිල්ලේ පියතුමා සහ ඥානප්‍රගාසර් පියතුමා ය.
(2) ලියෝ නානායක්කාර රදගුරුතුමා, ලක්ෂ්මන් වික්‍රමසිංහ රදගුරුතුමා සහ ඉව්ලින් කානි මැතිනිය ය.
(3) ලියෝ නානායක්කාර රදගුරුතුමා, ඩබ්ලිව්. එල්. ඒ. දොන් පීටර් පියතුමා සහ පීටර් පිල්ලේ පියතුමා ය.
(4) එඩ්මන්ඩ් පීරිස් රදගුරුතුමා, ලක්ෂ්මන් වික්‍රමසිංහ රදගුරතුමා සහ එස්. තන්නිනායගම් පියතුමා ය.
(5) පීටර් පිල්ලේ පියතුමා, එස්. ජී. පෙරේරා පියතුමා සහ ඉව්ලින් කානි මැතිනිය ය.

**35.** පහත සඳහන් නම් සැලකිල්ලට ගන්න.
A - ජාකොමේ ගොන්සාල්වෙස් පියතුමා
B - අතිගරු එඩ්මන්ඩ් පීරිස් රදගුරුතුමා
C - මර්සලින් ජයකොඩි පියතුමා
D - එස්. තන්නිනායගම් පියතුමා
E - ඩබ්ලිව්. එල්. ඒ. දොන් පීටර් පියතුමා

ඉහත සඳහන් අය අතුරෙන් කතෝලික සංගීතය වැඩි දියුණු කිරීමට උනන්දුවක් දැක්වූ අයගේ නම්වලට අදාළ අක්ෂර වන්නේ,
(1) A, B සහ C ය. (2) A, B සහ D ය. (3) A, C සහ D ය. (4) B, C සහ E ය. (5) C, D සහ E ය.

[පස්වැනි පිටුව බලන්න.

**36.** 'කොන්ස්තන්තීනු හටන' නමැති සිංහල කතෝලික කාව්‍යය ලියන ලද්දේ,
(1) අලගියවන්න මුකවෙටිතුමා ය.
(2) මර්සලින් ජයකොඩි පියතුමා ය.
(3) ඩබ්ලිව්. එල්. ඒ. දොන් පීටර් පියතුමා ය.
(4) ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමා ය.
(5) එස්. ජී. පෙරේරා පියතුමා ය.

**37.** සිංහල කතෝලික සාහිත්‍යයෙහි පියා වශයෙන් සැලකෙන්නේ,
(1) අතිගරු එඩ්මන්ඩ් පීරිස් රදගුරුතුමා ය.
(2) අලගියවන්න මුකවෙටිතුමා ය.
(3) ගරු. ඩබ්ලිව්. එල්. ඒ. දොන් පීටර් පියතුමා ය.
(4) ගරු ජාකොමේ ගොන්සාල්වෙස් පියතුමා ය.
(5) ගරු එස්. ජී. පෙරේරා පියතුමා ය.

**38.** දෙමළ කතෝලික සාහිත්‍යයෙහි පියා වශයෙන් සැලකෙන්නේ,
(1) එස්. තන්නිනායගම් පියතුමා ය.
(2) එච්. එස්. ඩේවිඩ් පියතුමා ය.
(3) හෙන්රි හෙන්රිකස් පියතුමා ය.
(4) එස්. ඒ. ඥානප්‍රගාසර් පියතුමා ය.
(5) ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමා ය.

**39.** "දෙමළ 'නාට්ටු කුත්තු' සිංහල නාඩගම් කලාව බිහිවීමට හා එය වැඩි වර්ධනය වීමට හේතු විය." මෙසේ ප්‍රකාශ කළ දෙදෙනා වන්නේ,
(1) මහාචාර්ය ඊ. ආර්. සරත්චන්ද්‍ර සහ එස්. ඒ. ඥානප්‍රගාසර් පියතුමා ය.
(2) එඩ්මන්ඩ් පීරිස් රදගුරුතුමා සහ එස්. ඒ. ඥානප්‍රගාසර් පියතුමා ය.
(3) ඩබ්ලිව්. එල් ඒ. දොන් පීටර් පියතුමා සහ එස්. ඒ. ඥානප්‍රගාසර් පියතුමා ය.
(4) මහාචාර්ය ඊ. ආර්. සරත්චන්ද්‍ර සහ එඩ්මන්ඩ් පීරිස් රදගුරුතුමා ය.
(5) එඩ්මන්ඩ් පීරිස් රදගුරුතුමා සහ ඩබ්ලිව්. එල් ඒ. දොන් පීටර් පියතුමා ය.

**40.** 1841 දී මධ්‍යම පාසල් කොමිෂන් සභාව පිහිටුවන ලද්දේ,
(1) ස්ටුවර්ඩ් මැකෙන්සි ආණ්ඩුකාරවරයා විසිනි.
(2) ක්‍රිස්ටෝපර් බොන්ජීන් රදගුරුතුමා විසිනි.
(3) ක්‍රිස්ටියන් ඩේවිස්තුමා විසිනි.
(4) මයිරන් වින්ස්ලෝතුමා විසිනි.
(5) තෝමස් මේට්ලන්ඩ් ආණ්ඩුකාරවරයා විසිනි.

More Past Papers at
tamilguru.lk

**41.** ශ්‍රී ලංකාවේ සේවය කළ පෘතුගීසි ජාතික ෆ්‍රැන්සිස්කාන ධර්මදූතවරුන් සම්බන්ධයෙන් **නො ගැළපෙන** ප්‍රකාශය තෝරන්න.
(1) ඔවුහු ශ්‍රී ලංකාව තුළ විදුහල් තුනක් පිහිටවූහ.
(2) ඔවුන්ගේ පාසල් ආගමික අධ්‍යාපනය මුල් කොටගෙන පිහිටුවන ලද ඒවා ය.
(3) කතෝලිකයන්ගේ ප්‍රමාණයට සරිලන පාසල් සංඛ්‍යාවක් පිහිටුවනු නොලැබී ය.
(4) ඔවුන් විසින් ද්විතීය පාසල් පිහිටුවනු නොලැබී ය.
(5) ඔවුහු දේශීය භාෂා ඉගෙනීමට උනන්දුවක් නොදැක්වූහ.

**42.** "ඉතා තදින් පැතිරී යන වසංගත තත්ත්වයේ වුව ද අපගේ පූජකවරු මනුෂ්‍යමය සේවාවන් හි යෙදුණා හ." මෙසේ පැවසූයේ
(1) විලී වික්‍රමසිංහ පියතුමායි.
(2) ආර්. එස්. ඩී. සේරම් දේවගැතිතුමායි.
(3) නිර්මාත්‍ර එයුජින් ද මැසනද් රදගුරුතුමායි.
(4) ලියෝ නානායක්කාර රදගුරුතුමායි.
(5) ෆ්‍රෑන්ක් මාකස් රදගුරුතුමායි.

**43.** දෙවන වතිකාන මන්ත්‍රණ සභාව සම්බන්ධයෙන් **නො ගැළපෙන** ප්‍රකාශය කුමක් ද?
(1) සභාව තුළ ගිහියන්ට විශේෂ ස්ථානයක් හිමි විය යුතු බව කාර්ල් රාහ්නර් හා ඊවෙස් කොන්ගා යන දේවධර්ම ශාස්ත්‍රඥවරු පැවසූහ.
(2) XXIII වන ජුවාම් ශුද්ධොත්තම පියාණන් විසින් දෙවන වතිකාන මන්ත්‍රණ සභාව අරඹන ලදී.
(3) සභාව සහ ලෝකය අතර සංවාදයක් තිබීමේ අවශ්‍යතාව ගැන අවධාරණය කරන ලදී.
(4) මෙම මන්ත්‍රණ සභාවට සහභාගී වූ සභා පියවරුන් විසින් සභා ධර්මතා රැකගැනීම නැවත අවධාරණය කළ අතර වේදභේද හෙළා දකින ලදී.
(5) මෙම මන්ත්‍රණ සභාව මගින් සභාවේ ගිහි සහ පැවිදි අය අතර ඇති පරතරය අවම කිරීමට මාර්ගය හෙළි කරන ලදී.

[ හයවැනි පිටුව බලන්න.

**44.** දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ නූතන ලෝකය තුළ ශුද්ධ වූ සභා ව්‍යවස්ථාව බිහිකිරීමට මන්ත්‍රණ සභා පියවරුන් මෙහෙයවන ලද්දේ,
(1) බ්‍රසීලයේ සහායක රදගුරුවරයකු ව සිටි හෙල්ඩර් කමාරා ය.
(2) ගරු හැන්ස්කුන්ග් දේවධර්මාචාර්යතුමා ය.
(3) ඊවෙස් කොන්ගා දේවධර්මාචාර්යතුමා ය.
(4) XXIII වැනි ජුවාම් ශුද්ධෝත්තම පියතුමා ය.
(5) VI වැනි පාවුලු ශුද්ධෝත්තම පියතුමා ය.

**45.** "පැවිදි නිකායවල විශ්වාසය හීනවීම සභාව තුළ බෙදීම් ඇතිවීමට හේතුවකි." මෙසේ පැවසුයේ,
(1) ශුද්ධ වූ කුරුසියේ ජුවාම්තුමා ය. (2) ශුද්ධ වූ සේල්ස්හි ෆ්‍රැන්සිස්තුමා ය.
(3) ශුද්ධ වූ පීටර් කැනිෂියස්තුමා ය. (4) ශුද්ධ වූ අවිලාහි තෙරේසාතුමිය ය.
(5) ශුද්ධ වූ පිලිප්නේරිතුමා ය.

**46.** ආසියාතික රදගුරු සමුළු සම්මේලන (FABC) නියෝජනය කරන රදගුරුතුමන්ලා අයත් රටවල් සංඛ්‍යාව

(1) 13 කි. (2) 14 කි. (3) 15 කි. (4) 19 කි. (5) 21 කි.

**47.** ශුද්ධ වූ සභාව තුළ එක්සත්කම ඇති කිරීම සඳහා ලෝක සභා සම්මේලනය යටතේ ක්‍රියාත්මක වන ශාඛා සංඛ්‍යාව
(1) 13 කි. (2) 14 කි. (3) 15 කි. (4) 19 කි. (5) 21 කි.

**48.** 1957 දී ආසියානු ක්‍රිස්තියානි සමුළු සම්මේලනයේ පළමු මහා සම්මේලනය පැවැත්වූ රට
(1) ජපානය ය. (2) කොරියාව ය. (3) ඉන්දුනිසියාව ය. (4) පිලිපීනය ය. (5) ශ්‍රී ලංකාව ය.

**49.** 1969 දී නව අධ්‍යාපන ප්‍රතිපත්ති හඳුන්වා දීමත් සමඟ පහත සඳහන් ස්ථාන අතුරෙන් කිහිපයක ගුරු අභ්‍යාස විද්‍යාල පිහිටුවන ලදී.
A - මග්ගොන
B - බෝලවලාන
C - කොළොම්බුතුරෙයි
D - පලාලි
E - මහරගම
ඉහත සඳහන් ඒවායින් ගුරු අභ්‍යාස විද්‍යාල පිහිටවූ ස්ථාන දැක්වෙන අක්ෂර වන්නේ,
(1) A, B සහ C ය. (2) A, B සහ D ය. (3) A, C සහ D ය. (4) A, C සහ E ය. (5) A, D සහ E ය.

**50.** කොළඹ අගරදගුරු පදවියේ ඇක්වයිනස් උසස් අධ්‍යාපන ආයතනය ආරම්භ කරන ලද්දේ,
(1) ඩබ්ලිව්. එල් ඒ. දොන් පීටර් පියතුමා ය.
(2) ක්‍රිස්ටෝපර් බොන්ජීන් රදගුරුතුමා ය.
(3) පීටර් පිල්ලේ පියතුමා ය.
(4) එඩ්මන්ඩ් පීරිස් රදගුරුතුමා ය.
(5) එස්. ජී. පෙරේරා පියතුමා ය.

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2015 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2015 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2015

ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය II
கிறிஸ்தவ நாகரிகம் II
Christian Civilization II

49 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

*උපදෙස්:*
- ❊ I කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, II කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
- ❊ සෑම ප්‍රශ්නයකට ම ලකුණු **20** බැගින් හිමි වේ.

## I කොටස

1. (i) ඇලෙක්සැන්ඩ්‍රියානු සහ අන්තියෝකියානු ගුරුකුලවල ඉගැන්වීම් **දෙක** බැගින් ලියන්න.
   (ii) සභාවේ මුල් යුගයේ සිටි සභා පියවරුන් **හතරදෙනකු** නම් කරන්න.
   (iii) මධ්‍යකාලීන සභාවෙන් අධ්‍යාපනයේ වර්ධනයට සිදු වූ සේවා **හතරක්** සඳහන් කරන්න.
   (iv) විද්‍යාවේ වර්ධනය සඳහා දායක වූ කිතුනු විද්‍යාඥයින් **හතරදෙනකුගේ** නම් ලියන්න.
   (v) අධ්‍යාපනයෙහි සහ වෘත්තීය සේවාවල වර්ධනය සඳහා ශ්‍රී ලංකාවේ සභාව දායක වී ඇති ආකාරය පිළිබඳ කරුණු **හතරක්** ලියන්න.

2. (i) ආසියානු රදගුරු සමුළු සම්මේලනයට (FABC) අයත් රටවල් **හතරක්** නම් කරන්න.
   (ii) ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයට අයත් සභා **හතරක්** නම් කරන්න.
   (iii) මුල් ක්‍රිස්තියානීන්ගේ සමාජීය ජීවිතය තුළ දක්නට ලැබුණු ගුණාංග **හතරක්** සඳහන් කරන්න.
   (iv) හතරවෙනි ශතවර්ෂයේ සිට රෝම අධිරාජ්‍යය පුරා ක්‍රිස්තියානි ධර්මය පැතිර යාමට හේතු වූ කරුණු **හතරක්** ලියන්න.
   (v) "ක්‍රිස්තුන් වහන්සේගේ දෙවන පැමිණීම ඉතා ඉක්මනින් සිදු වේ" යන බලාපොරොත්තුව මුල් ක්‍රිස්තියානීන්ගේ ජීවිතය කෙරෙහි ධනාත්මක ව බලපෑ ආකාරය පිළිබඳ ව කරුණු **හතරක්** සඳහන් කරන්න.

3. (i) ඉග්නේෂියස් ලොයෙලාතුමන්ට තමන්ගේ 'ආධ්‍යාත්මික අභ්‍යාස' (Spiritual Exercises) ග්‍රන්ථය රචනා කිරීමට උපකාරී වූ ග්‍රන්ථ **හතරක්** නම් කරන්න.
   (ii) කුරුසියේ ජුවාම්තුමා විසින් ආධ්‍යාත්මික ජීවිතය පිළිබඳ ව රචනා කරන ලද ග්‍රන්ථ **හතරක්** නම් කරන්න.
   (iii) ප්‍රොතෙස්තන්ත ප්‍රතිසංස්කරණයට පසුව ජේසු නිකායික පියවරුන් විසින් කතෝලික ධර්මය හඳුන්වා දුන් රටවල් **හතරක්** සඳහන් කරන්න.
   (iv) ප්‍රොතෙස්තන්ත ප්‍රතිසංස්කරණයේ ප්‍රතිඵලයක් ලෙස කතෝලික සභාවට ලැබුණු වාසි **හතරක්** සඳහන් කරන්න.
   (v) මොසැයික් කලාවේ ගුණාංග **හතරක්** දක්වන්න.

## II කොටස

4. ලෝක ශිෂ්ටාචාරයත්, ක්‍රිස්තියානි ශිෂ්ටාචාරයත් එකිනෙකේ වර්ධනය සඳහා අන්‍යෝන්‍ය වශයෙන් දායක වී ඇත.
   (i) නයිල් නිම්න ශිෂ්ටාචාරය පිළිබඳ ව විස්තරයක් කරන්න.
   (ii) ජුදා ශිෂ්ටාචාරයේ වර්ධනය සඳහා පලස්තීනය අවට රටවල එවකට පැවැති ශිෂ්ටාචාරවල බලපෑම පැහැදිලි කරන්න.
   (iii) ක්‍රිස්තියානි ධර්මයේ ආරම්භයත් සමඟ නව සමාජ ක්‍රමයක් බිහි වූ ආකාරය විස්තර කරන්න.
   (iv) යුරෝපා ශිෂ්ටාරයේ වර්ධනය සඳහා සභාවේ දායකත්වය පැහැදිලි කරන්න.

[දෙවැනි පිටුව බලන්න.

**5.** සභාවේ ආධ්‍යාත්මික හා සාමාජීය සංවර්ධනයට තාපස සහ පැවිදි නිකායන් බොහෝ සේ උපකාරී විය.

(i) කිතුනු තාපස දිවියේ ආරම්භය පිළිබඳ ව විස්තරයක් කරන්න.

(ii) වැඩ කිරීම සම්බන්ධ ව බෙනඩික්ටාන තාපස නිකායේ ආකල්පය පැහැදිලි කරන්න.

(iii) යාචක නිකායන් බිහිවීමට පාදක වූ පසුබිම විස්තර කරන්න.

(iv) යුරෝපයේ අධ්‍යාපනයේ වර්ධනය සඳහා තාපස සහ පැවිදි නිකායන්ගෙන් සිදු වී ඇති සේවාව විස්තර කරන්න.

**6.** සභාව ආරම්භක යුගයේ සිට ම සුභසාධන සහ දයාවේ කටයුතු වෙනුවෙන් කැප වී ඇත.

(i) මුල් යුගයේ දී සභාව දයාවේ කටයුතුවල නියැලුණු ආකාරය විස්තර කරන්න.

(ii) ත්‍රිදෙන්තියානු මන්ත්‍රණ සභාවෙන් පසු බිහි වූ පැවිදි නිකායන් දයාවේ සහ සුබසාධන කටයුතුවල නිරත වූ ආකාරය විස්තර කරන්න.

(iii) විදේශීය ධර්මදූතවරුන් ශ්‍රී ලංකාව තුළ දයාවේ කටයුතුවලට දායක වූ ආකාරය පැහැදිලි කරන්න.

(iv) වත්මන් ශ්‍රී ලාංකීය සභාව රටේ සමාජ සුබසාධන කටයුතුවලට දායක වී ඇති ආකාරය විස්තර කරන්න.

**7.** සභාව අධ්‍යාපනය සම්බන්ධයෙන් විශේෂ උනන්දුවක් දක්වා ඇති අතර ඒ සඳහා මහත් සේ දායක වී ඇත.

(i) 1960 දී පාසල් රජයට පවරා ගැනීම නිසා ඇති වූ ධනාත්මක සහ සෘණාත්මක ඵල මොනවා දැ'යි විස්තර කරන්න.

(ii) ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය සම්බන්ධයෙන් වත්මන් කතෝලික සභාව ලබා දී ඇති දායකත්වය පැහැදිලි කරන්න.

(iii) මධ්‍යකාලීන යුරෝපයේ ගෘහ නිර්මාණ ශිල්පය වෙනුවෙන් සභාවේ දායකත්වය විස්තර කරන්න.

(iv) ක්‍රිස්ටෝපර් බොන්ජීන් අගරදගුරුතුමා පිළිබඳ ව කෙටියෙන් සඳහන් කොට, ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ වර්ධනය සඳහා එතුමාගෙන් ඉටු වී ඇති සේවාව විස්තර කරන්න.

**8.** සභාව සැම විට ම සියලු කිතුනු සභාවල එකමුතුකමේත් අනෙකුත් ආගම් සමග සංවාදයේ යෙදීමේත් අවශ්‍යතාව ඉස්මතු කොට දක්වයි.

(i) "ක්‍රිස්තියානි සභා අතර වූ භේදකාරී ස්වභාවය විසිවන ශතවර්ෂයේ සිට ක්‍රමයෙන් පහව් යන්නට පටන්ගෙන ඇත." මෙයට හේතු පැහැදිලි කරන්න.

(ii) ක්‍රිස්තියානි සභා අතර එක්සත්භාවය නගාලීම සම්බන්ධයෙන් දැක්විය හැකි බයිබලීය සහ ඓතිහාසික හේතු පැහැදිලි කරන්න.

(iii) ශ්‍රී ලංකාවේ වෙසෙන විවිධ ජනවාර්ගික කොටස් අතර සමගිය ඇති කිරීම සඳහා කිතුනුවකු වශයෙන් ඔබගේ යෝජනා මොනවා දැ'යි දක්වන්න.

(iv) ශ්‍රී ලංකාවේ පවතින විවිධ ආගම් අතර සුහදතාවක් ඇති කළ හැක්කේ කෙසේ දැ'යි විස්තර කරන්න.

* * *

More Past Papers at
tamilguru.lk